කොළඹදී පවත්වනු ලබන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක

කරන) බස්නාහිර පළාත්බද මහාධිකරණයේදී ය.

මහාධිකරණ විනිසුරු ගාමිණී අමරසේකර මැතිතුමා ඉදිරිපිටදී ය.

වාර්තා කරන්නේ :- ඩී.එම්.ඩී.බී.රංගා විසිනි.

නඩු අංකය:- 19/2012/CO.

දිනය:- 2013.03.27

ඩී.එම්.එස්.ජයවර්ධන

පෙත්සම්කරු

එදිරිව

01. සමාගම් රෙජිස්ට්‍රාර් සහ තවත් හතර දෙනෙක්.

වගඋත්තරකරුවන්.

නියෝගය

මෙම නඩුව මුලිකව පෙත්සම්කරු පවරන ලද්දේ 2 වන වගඋත්තරකාර සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීමට

නියෝග ලබා ගැනීමට හා ඊට ආනුසාංගික සහන ලබා ගැනීමට වේ. ඊට අදාලව විරෝධතා බැඳීම කල පසු සම්බන්ධ 20/2012/සී.ඕ නඩුව සමඟ 2012.12.05 දිනට විමසීමට තිබුනු අතර, එදින පෙත්සම්කරුගේ ඉල්ලීම අනුව ප්‍රතිවිරෝධතා සඳහා (බාර ගැනීම සම්බන්ධ විරෝධතා සැලකීමට යටත්ව) 13/01/23 තෙක් කල් ලබා දෙන ලදී. එදිනද දින අයැදීම මත ඒ සඳහා 13/03/27 දින ලබා දීම කර ඇති අතර, ඒ සඳහා එලෙස දින නියමව තිබියදී පෙත්සම්කරු විසින් අතුරු නියෝග ඉල්ලා 2013.02.01 දාතම පෙත්සම් හා දිවුරුම් පෙත්සම් 2013.02.05 දින දී ගොනු කර ඇත. කෙසේ වෙතත් මුල් අවස්ථාවේදීම අතුරු නියෝග නොසලකන ලද අතර, නොතීසි දීමෙන් පසු සැලකීමට තබන ලදී. කෙසේ වෙතත් 2 විත්තිකාර සමාගමේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කරන බවට කාරණා ඉදිරිපත් කිරීම සලකා නොතීසි වාර්තා වීමට හා විරෝධතා සඳහා ඉහත කෙටි දින ලබා දෙන ලදී. 2013.06.06 දින සම්බන්ධ නඩුව වන 20/2012/සීඕ සමඟ එකට ගෙන නඩු දෙකෙහිම ඉල්ලා සිටින අතුරු නියෝග තහවුරු කරමින් කරුණු කියා සිටින ලද අතර, ඊට ප්‍රතිවිරුද්ධවද කරුණු කීම අරඹන ලදී. නමුත් ප්‍රතිවිරුද්ධ පාර්ශවයන්ට කරුණු කියා අවසන් කිරීමට කාලය මද වූ බැවින් වැඩිදුර කරුණු කීම කල් තැබීමට සිදු වන අවස්ථාවේදී අතුරු නියෝග පිළිබඳ විමසීම පවත්නා තුරු ලෙස පාර්ශවයන් අතර එකඟතාවයක් ලෙස පහත එකඟතාව ඇති වන ලදී.

එනම් පෙත්සම්කාර පාර්ශවය සහ වගඋත්තරකාර ඔබේසේකර හෝ අලීෆ් යන අය හෝ අයකු අත්සන් නොකර බැංකුව වෙත උපදෙස් නොදිය යුතු බවත්, එම අවස්ථාවේ සිට පෙත්සම්කාර ජයවර්ධන සහ වගඋත්තරකාර ඔබේසේකර හෝ අලීෆ් යන අයගෙන් අයකු අත්සන්කරු නොවන චෙක්පත් ~~පෙත්සම්කාර~~ බැංකුවට ඉදිරිපත් නොකළ යුතු බවත්, බැංකුව ඊට අනුකූල නොවන විට ඒවාට ගරු නොකළ යුතු බවත් එම එකඟතාවයයි. එමෙන්ම සමාගමේ මූල්‍ය පාලක හෝ වෙනත් අයවලුන් හට අතුරු නියෝග විමසීම අවසන් වනතුරු චෙක්පත් අත්සන් කිරීමට හා/හෝ බැංකුවට උපදෙස් දීමට බලයක් නොමැති බවට ද වැඩිදුර කරුණු පැහැදීමක් ලෙස එකඟ වී ඇත.

අංක 03 අධිකරණයට යා යුතු 20/2012/සී.ඕ. නඩුව මෙම අධිකරණයේදී මෙම නඩුව සමඟ ගැනීමට කටයුතු කිරීම ද, අතුරු නියෝග දීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරන තුරු ඉහතකී ලෙස අතුරු එකඟතාවකට ඇතුළු වීමද පෙත්සම්කරුගේ වුවමනාව හා ඉල්ලීම මත සිදු වූ දේ වේ. වගඋත්තරකරුවන් අතුරු නියෝග ඉල්ලා සිටි පාර්ශව නොව ඒ ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටි පාර්ශව වේ. නඩු දෙකෙහිම කාරණා (අතුරු නියෝග අයැදීමට අදාලව) එකිනෙකට සම්බන්ධ වීම නිසා අතුරු නියෝග තහවුරු කිරීම හා ඊට විරුද්ධව කරුණු කීම එකට එක්වර සිදු කෙරින. ඒ අනුව ඇති වූ එකඟතාව ද නඩු දෙකටම අදාලව එකට එක්වර ඇති වූ එකඟතාවක් වේ.

(බලන්න 2013.03.06 සටහන් ආරම්භයේ නඩු අංක පවා එකට සටහන් කර ඇත. 2013.03.06 තෙක් අනෙක් දිනවල පවා නඩු අංක සටහන් කිරීම හැර එකම සටහන් එකට ගෙන ඇති බව පෙනේ.). මේ අනුව එකඟතාව දැක්වූයේ නඩු දෙක සඳහාම එක එකඟතාවයක් ලෙස බවට වන වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වඩා නිවැරදි ලෙස සැලකිය යුතු වේ. අධිකරණයේ ඇති වන සමථය, එකඟතාවයන් පාර්ශවයන් අතර වන ගිවිසුමක් හා සම වේ. අධිකරණයේ අධිකාරී බලය තුළින් තවදුරටත් ශක්තියක් වන ගිවිසුමක් බවට එය පත් වේ. මෙම නඩුවේ අවස්ථානුගත කරුණු අනුව වගඋත්තරකාර පාර්ශවය තමන් එකඟතාවකට පත් වන්නේ නඩු දෙක වෙනුවෙන්මය ලෙස සිතීමට පසුබිම් ගත කරුණු ඇත. නඩු දෙක වෙනුවෙන් වෙන් වෙන් ලෙස එකඟතාවයකට ඇතුළු වීමක් එදින වී නැති අතර නඩු දෙක සඳහාම කරන ලද සටහන්වල එකඟතාවයේදී නඩු අංක වෙන්ව සඳහන් නොකර එකඟතාව සටහන් කිරීම තුළ ද එය පෙනේ. අනෙක් අතට අතුරු නියෝග හා ඒ සඳහා විමසීම අවසන් වනතුරු එකඟතාවයක් තුළින් හෝ අතුරු නියෝග ඉල්ලා සිටියේ හා අපේක්ෂා කලේ පෙත්සම්කාර පාර්ශවය වේ. අතුරු නියෝග ඉල්ලා නොසිටි වගඋත්තරකාර පාර්ශවයන්ට ඒ සඳහා එකඟවීමට අනෙක් පාර්ශවයට ලැබෙන වාසිය/පොරොන්දුව නඩු දෙක සඳහාම එකඟතාවයට පත්වීම ලෙස ඔවුන් සැලකූ බව ඔවුන් දක්වන කරුණු අනුව පෙනේ.

තත්ත්වය මෙසේ තිබියදී නඩුවේ ඉදිරි දිනය ~~පැවරීමකට~~ පැමිණීමට පෙරම තමන් ඇති කරගත් එකඟතාවෙන් මෙම නඩුවෙන් මිදීම අපේක්ෂාවෙන් මෙම නඩුවට අදාලව පමණක් අතුරු නියෝග ඉල්ලීම ඉවත් කර ගැනීමට පෙත්සම්කරු ඉල්ලා ඇත. මෙම ඉල්ලීමට අදාලව පාර්ශව කරුණු දක්වීම මත මෙම නියෝගය නියමිත වේ.

නඩු දෙකක් එක්වර එකට ගත්තේ වුවද, නොවුවද යම් පවතින ඉල්ලීමක් නැවත ගෙන ඒමේ අයිතිය නොරඳවා ගෙන පවත්වාගෙන යෑම අත්හැර ඉවත් කර ගන්නේ නම් එම පාර්ශවයට ඊට ඉඩ දීම මිස වැළැක්වීමට හැකියාවක් නැත. මන්ද ඉල්ලීම ඔවුන්ගේ බැවින් එය ගෙන යෑම අවශ්‍ය නොවේ නම් ඉල්ලීම පවත්වාගෙන නොයෑමට ඔවුන්ට අයිතියක් ඇති බැවිනි. නමුත් මෙම නඩුව ද තවත් නඩුවක් ද එක්ව ගෙන එක් විමසීමක් පවතිද්දී එකී විමසීම මුල් කර එය පවතින තුරු එකඟතාවකට, සමථයකට අනෙක් පාර්ශවය පොළඹවා ගත් පසු එකී විමසීමට අදාළ එක් නඩුවක ඉල්ලීම ඉවත් කරගත් පමණින් අනෙක් නඩුවේ ඉල්ලීම පවතිද්දී හා ඒ අනුව විමසීම තවදුරටත් පවතිද්දී එක් නඩුවකට පමණක් බලපාන ලෙස සමථය නැතහොත් එකඟතාව එක් පාර්ශවයක (ඉල්ලීම ඉවත් කර ගැනීමට ඉල්ලන පාර්ශවයේ) කැමැත්තට අනුකූල වන ලෙස සංශෝධනය වන ලෙස කටයුතු කළ නොහැකි බව මාගේ මතයයි. ඒ සඳහා අනෙක් පාර්ශවය ද එකඟතාව පළ කළයුතු වේ. මෙහිදී විරුද්ධ වගඋත්තරකාර පාර්ශවය ඒ සඳහා එකඟතාව පළ කර නැත. එකට ගැනීම තුළ

එකම එකඟතාව ඇති වූ විමසීම තවදුරටත් අනෙක් තඩුව විෂයෙහි පවතී. ඒ අනුව විමසීම පවතින තුරු එකඟතාව පැවතිය යුතු බව මාගේ මතයයි. මන්ද යත් විරුද්ධ වගඋත්තරකාර පාර්ශව එකඟතාවට/සමථයට එළඹෙන්නේ තඩු දෙකෙහිම විමසීම් සලකා මිස එකිනෙක වෙන්ව සලකා නොවන බව පෙනී යන හෙයිනි.

මෙම අතුරු නියෝගය පිළිබඳ ඉල්ලීම් ඉවත් කර ගැනීමට ඉල්ලන්නේ එකඟතාව පරිදි වගඋත්තරකරුවන් චෙක්පත් අත්සන් නොකිරීම තුළ සමාගමේ කටයුතු අගතියට පත් වන බව කියමිනි. නමුත් ඇති වූ එකඟතාව පරිදි සමාගම/පෙත්සම්කරු ඉදිරිපත් කරන චෙක්පත් අනිවාර්යයෙන්ම වගඋත්තරකරුවන් අත්සන් කළයුතු බවට එකඟතාවක් නොමැත. වගඋත්තරකාර පාර්ශවය දක්වන්නේ අධ්‍යක්ෂකවරුන් ලෙස තම වගකීම් ඉටු කිරීමේදී කරුණු තහවුරු කර නොගෙන චෙක්පත් අත්සන් කිරීම තම වගකීම් හා යුතුකම් පැහැර හැරීමක් වනු ඇති බවයි. ඒ සඳහා කරුණු තහවුරු කර ගැනීමට කාර්යාලයට යා යුතු වුවත් ඒ පෙත්සම්කරු වළක්වාලන නිසා චෙක්පත් අත්සන් කිරීමට අකැමැත්තක් නොව නොහැකියාවක්/බාධාවක් ඇති වී ඇති බවයි. පෙත්සම්කරු විසින් වගඋත්තරකරුවන්ව එකඟතාවයට පෙර සේවයක් නෙරපා හැර ඇති නිසා කාර්යාලයට පැමිණීමට ඉඩ දීමට පෙත්සම්කරු කටයුතු නොකරන බව ද කරන කරුණු දැක්වීම් අනුව පෙනේ. කෙසේ වෙතත් චෙක්පත් ඉදිරිපත් කළ පමණින් යමකු අත්සන් කළයුතු යැයි

සාධාරණව අපේක්ෂා කල නොහැකිය. ඒ සඳහා වඩා සුදුසුම දෙය ඒ චෙක්පත්වලට පසුබිම සකසන ලේඛන පවතින ස්ථානයට (කාර්යාලයට) අඩු තරමින් යම් නිශ්චිත අවස්ථාවක හෝ පරීක්ෂා කිරීමට පැමිණීමට ඉඩ දී, අත්සන් කිරීමට අවස්ථාව සලසා දීමය. එසේ නොවන්නට ප්‍රතිවිරුද්ධ පාර්ශවය වන පෙත්සම්කරු එවන චෙක්පත්වලට, ඔහු එවන ලේඛන මත විශ්වාසය තබා අත්සන් කිරීමට වගඋත්තරකරුවන්ට සිදු වනු ඇත. එය ප්‍රශස්ථ තත්ත්වයක් නොවනවා මෙන්ම පාර්ශවයන් අතර පවතින විරුද්ධවාදිකම් සලකන කල වගඋත්තරකාර පාර්ශවයට අගතිදායක, ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයක්ද ඇති කිරීමට ඉඩ ඇත. මේ අනුව චෙක්පත් වගඋත්තරකරුවන් අත්සන් නොකිරීම යන චෝදනාව තුළ වගඋත්තරකාර පාර්ශවය මතම දොස් තැබිය හැකි තත්ත්වයක් ද නොදකින බව සටහන් කර තබමි. ඒ අනුව එකඟතාව ඉටු කිරීමට නොහැකි වීමට පාදක වන්නේ වගඋත්තරකරුවන්ගේ හැසිරීම පමණක් නොවේ. ඊට මුල් වන චෙක්පත් අත්සන් කිරීමට සාධාරණව අවශ්‍ය වන පසුබිම නොසලසා සිටි පෙත්සම්කරුගේ ක්‍රියාකාරිත්වයක් ද ඇත. ඒ තුළ ද දැක්වූ එකඟතාව/සමථය පෙත්සම්කරුගේ අභිලාපය තුළම මෙම නඩුවට අදාළව පමණක් අහෝසි වන ලෙස කටයුතු කිරීමේ හැකියාවක් නොමැත. එය මෙම නඩුව පමණක් සලකා ඇති කරගත් අතුරු එකඟවීමක් (නියෝගයක්) නම් විමසීම මෙම නඩුවට අදාළව අහෝසිවීම මත ඉවත් වන ලෙස සැලකිය හැකිව තිබුනි. නමුත් එය නඩු දෙකටම පොදු විමසීමක් අරබයා ඇති කරගත්

අතුරු එකගතාවක් වන විට, නඩු දෙකටම පොදු වූ දැන් පෙත්සම්කරුගේ ක්‍රියාකාරිත්වය තුළ අනෙක් නඩුවට පමණක් සීමා වන විමසීමක් බවට පත් වන විමසීම හමුවෙහි අනෙක් පාර්ශවයන්ට අවාසියට එකගතාව/සමථය සංශෝධනය වන ලෙස නැතහොත් වෙනස් වියයුත ලෙස සැලකීම කළ නොහැක.

අනෙක් අතට මෙම අතුරු නියෝගය සඳහා වන ඉල්ලීම ඉවත් කර ගැනීමට පසුබිමෙහි වන අනෙකුත් කරුණු ද සටහන් කළයුතු වේ. අතුරු නියෝගය ඉල්ලා සිටින්නේ 2 විත්තිකාර සමාගමේ මුදල් 3, 4 වගඋත්තරකරුවන් සාවද්‍ය ලෙස තම පුද්ගල වාසිය සඳහා භාවිතා කරන්නේය යන පදනමිනි. ඒ සඳහා ප්‍රධාන කාරණා කීපයක් අතුරු නියෝගය ඉල්ලූ පෙත්සමේ මතු කර තිබුනි. ඒවා නම්;

01. 2 වන වගඋත්තරකාර සමාගමේ ගිණුමින් මුදල් මිල්හෝඩ් එක්ස්පෝර්ට් (සිලෝන්) ලිමිටඩ් හි ජංගම ගිණුමට මාරු කිරීම:- විරුද්ධව කරුණු කීම අවසන් කර නැතත් විමසීමේදී මීට අදාලව මිල්ෆෝඩ් එක්ස්පෝර්ට් (සිලෝන්) ලිමිටඩ්හි මුදල් 2 වන වගඋත්තරකාර සමාගම භාරයේ පැවති බවට කරුණු ඉදිරිපත් කරමින් තිබුනි.

02. මිල්ෆෝඩ් එක්ස්පෝර්ට් (සිලෝන්) ලිමිටඩ් හට ජ්බොල්ටාහි නඩු කටයුත්තක් නොමැතිව, නීති ගාස්තු ගෙවීමට නොමැතිව 3, 4 වගඋත්තරකරුවන්ගේ පුද්ගලික ගාස්තු ගෙවීමට 2 වන

වගඋත්තරකරු ගේ මුදල් භාවිතා කිරීමට 3, 4 වගඋත්තරකරුවන් කටයුතු කරන බව :- මීට අදාලව ඉහතකී අවසාන නොවූ විමසීමේදී තඩු කටයුතු තිබුනේ මිල්කෝඩ් එක්ස්පෝර්ට් (සිලෝන්) ලිමිටඩ් හි අයිතිවාසිකම් රැක ගැනීමට බවත්, පෙත්සම්කරු ඊට හිමි වත්කම් අනිසි ලෙස ලබා ගනිමින් සිටි බවටත් කරුණු කියමින් තිබුනි.

03. 3. 4 වගඋත්තරකරුවන් බී.එම්.ඩබ්. රථ දෙකක් ඔවුන්ගේ ප්‍රයෝජන සඳහා ගැනීම :- මෙයට අදාලව පෙත්සම්කරුද ඊට වඩා වටිනා රථයක් ලබාගෙන ඇති බවටත්, මෑත සිදුවීමක් නොවන බවටත්, සාමාන්‍ය කටයුතු කල ආකාරය තුල ක්‍රියා බවටත් විමසීමේදී කරුණු කියමින් තිබුණි.

04. 3, 4 වගඋත්තරකරුවන් පෙත්සම්කරුගේ අනුදැනුම, කැමැත්ත රහිතව, අධ්‍යක්ෂක හෝ කොටස් හිමි රැස්වීමකින් තොරව දෙවන වගඋත්තරකාර සමාගමේ ලාභාංශ ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව:- මීට අදාලව පෙත්සම්කරු පවා ඹ ඒ ලාභාංශ ලබාගෙන ඇති බවට හා කාලයක් ගතවූ ක්‍රියා බවට විමසීමේදී කරුණු හෙළි කරමින් තිබුණි.

ඉහත කරුණු වලට අමතරව අතුරු නියෝග වල අරමුණ දෙවන වගඋත්තරකාර සමාගම පාලනය විෂයෙහි පෙත්සම්කරුගේ බලය තහවුරු කර ගනිමින්, 3, 4 වගඋත්තරකරුවන්ට පෙත්සම්කරුගේ අනුදැනුමින් හා කැමැත්තෙන් තොරව කටයුතු කිරීමට නොහැකිවන ලෙස සීමා ඇති කිරීම බවටත් ( පෙත්සම්කරුට

නොමැති සීමා ඇති වන ලෙස) කරුණු විමසීමේදී කියා සිටිමින් තිබුණි.

විමසීමේදී පවසන ලද කාරණා විෂයෙහි තීරණය කිරීම විමසීම අවසානයේදී කලයුතුව ඇත. (එකට ගත් විමසීම 20/2012/සි.ඕ. ට අදාලව තවම පවතී ). නමුත් අතුරු නියෝග අයැදීම හා එය ලබා ගැනීමට පෙත්සම්කරුට හිමිකම හා සුදුසුකම් ඇති ද පිළිබඳව හා පෙත්සම්කරු පිරිසිදු දෑතින් යුතුව පැමිණ ඇතිද යන්නට අදාලව බරපතල ලෙස ප්‍රශ්න ගත වන ලෙස කරුණු ඉදිරිපත් කරමින් තිබුණි. මේ අනුව අතුරු නියෝග ඉල්ලීම ඉවත් කර ගැනීමට ඉල්ලන්නේ වෙක්පත් අත්සන් නොකිරීමේ එකඟතාව ඉටුනොවන පසුබිමක පමණක් නොව අතුරු නියෝග ඉල්ලීම සැලකිය යුතු ලෙස අභියෝගයට ලක් වන පසුබිමකදී ද වේ.

ඉහත කරුණු සමස්ථව සලකන කල පහත තීරණයන්ට එළඹෙමි.

1. අතුරු නියෝග ඉල්ලීමට අදාල පෙත්සම හා අයැදීම ඉවත් කර ගැනීමට පෙත්සම්කරුට හිමිකම ඇත. එය වැලැක්වීමේ හැකියාවක් නැත. ඊට ඉඩදෙමි.
2. නමුත් පොදු විමසීම අවසන් වනතුරු ඇතිවූ එකඟතාවෙන් මේ නඩුවට අදාලව පමණක් ඒකපාක්ෂික කැමැත්ත හා මනාපය

තුලින් ඉවත් වීමේ හැකියාවක් පෙත්සම්කරුට නැත. ඒ සඳහා පැවති පොදු විමසීම අවසන් වන ලෙස අනෙකුත් නඩුවේද අතුරු නියෝග ඉල්ලීම ඉවත් කර ගැනීම හෝ විමසා අවසන් කිරීම අවශ්‍ය වනු ඇත. (එකඟතාව ඇතිවී ඇත්තේ විමසීම අවසන් වනතුරු එකඟතාවේ සඳහන් ලෙස කටයුතු කිරීමට වන බැවිනි).

අතුරු නියෝග ඉල්ලීම ඉවත් කරගන්නා හෙයින් වගඋත්තරකරුවන් ගාස්තු ඉල්ලා ඇත. ඔවුන් දරන ලද ගාස්තු හෝ ආදර්ශ ගාස්තු ඉල්ලා සිටින බව පෙනේ. ඔවුන්ට තක්සේරු ගාස්තු සඳහා වන හිමිකම අතුරු නියෝග ඉල්ලීම පවත්වාගෙන නොයෑම තුල අභියෝග කල නොහැකිය. දරන ලද ගාස්තු ගෙවීම සඳහා පාර්ශවයන් අතර එකඟතාවයක් නැත. ආදර්ශ ගාස්තු ගෙවිය හැක්කේ පීඩාකාරී හා නිරර්ථක ඉල්ලීමක් බවට තීරණය කරන විටකය. තවම 20/2012/සි.ඕ. නඩුවට අදාලව විමසීම පවතී. එය අවසන් වනතුරු එකම කරුණු මත පවතින ඉල්ලීම නිරර්ථක හෝ පීඩාකාරී ලෙස තීරණය කිරීම සුදුසු නැත. එය සිද්ධිමය කාරණා මත තීරණය කරන එකී විමසීමේදී විය යුතුය. ඒ නිසා ආදර්ශ ගාස්තු හා ප්‍රමාණ තීරණය කරන්නේ නම් එය එකී විමසීමේදී තීරණය කිරීමට තැබිය යුතු වේ. එයින් පසු පමණක් මෙම ඉවත් කර ගැනීම වෙන්පත් අත්සන් නොකිරීම තුල පැන නැගී සුවිශේෂ තත්ත්වයක්ද නැත්නම් මුල

සිටම ඉල්ලීම පීඩාකාරී හා නිරර්ථක ද ලෙස තීරණය කල හැකි වනු ඇත.

කෙසේ වෙතත් ප්‍රධාන ඉල්ලීම අසා අවසන් කිරීම සඳහා විමසීමට තැබීම ප්‍රමාද වන ලෙස අතුරු නියෝග ඉල්ලමින් එය හදිසි බවට දක්වමින් ඉක්මණින් කටයුතු කිරීමට අධිකරණ හා පාර්ශව යොමු කරමින් තාවකාලික අතුරු නියෝග එකඟතා තුල ලබාගෙන එයද අහෝසි ~~වන ලෙස~~ කරවන පරිදින් ඉල්ලීම ඉවත් කර ගනිමින් කටයුතු කරන විට වගඋත්තරකාර පාර්ශවයට, ප්‍රධාන විමසීම පසෙකලා අගතිදායක ලෙස වියදම් හා කාලය වැය කරමින් හදිසි තත්ත්වය තුල කටයුතු කිරීමට වීම පීඩාකාරී වියහැකි බව සටහන් කර තබමි. මන්ද අතුරු නියෝග සඳහා පිළිගත හැකි පසුබිමක් හෝ කරුණු නොතිබුනි නම් පෙත්සම්කරුගේ එවැනි හැසිරීමකින් වගඋත්තරකරුට පීඩාකාරී තත්ත්වයක් ඇති වන බැවිනි.

කෙසේ වෙතත් 20/2012/සි.ඕ. ඉල්ලීමේදී මෙම ඉල්ලීම් වලට පසුබිම් කාරණා මත අතුරු නියෝග ඉල්ලීම පීඩාකාරී හා නිරර්ථක බවට කරුණු මත තීරණය කලහොත් හා ආදර්ශ ගාස්තු දීමට තීරණය කලොත් මෙහිදීද එහි නියම කරන ප්‍රමාණයට ආදර්ශ ගාස්තු හිමි බවට තීරණය විය යුතු බව සටහන් කර තබමි. යම් හෙයකින් එම අතුරු නියෝග ඉල්ලීමද ඉවත් කරගතහොත් හදිසි ලෙස දක්වා අතුරු නියෝග ඉල්ලා ඉල්ලීම් ගොනු කර පවත්වාගෙන නොයැමෙන්

ඇති වන පීඩාකාරී තත්ත්වය සලකා හා අතුරු නියෝග ඉල්ලීමට හා ඉල්ලීම ඉවත් කර ගැනීමට පසුබිම්ද සලකා සුදුසු ආදර්ශ ගාස්තු නියම කිරීමට ඉඩකඩ තබන්නෙමි.

මේ අනුව ආදර්ශ ගාස්තු හිමිකරන්නේද යන්න තීරණය 20/2012/සි.ඕ. නඩුවේ විමසීමේදී පසුබිම් ගත සිද්ධිමය කාරණා සැලකීමෙන් පසු හා/හෝ එය ඉවත් කර ගතහොත් එයට පසුබිම්ගත කරුණු සලකා පසුව තීරණය කිරීමට තබමි.

(ගාමිණී අමරසේකර)

මහාධිකරණ විනිසුරු,

කොළඹ.

2013.03.27